MAHAMAYA GIRLS' COLLEGE මහ/මහාමායාබාලිකාවිදුහල

පරීක්ෂණය - 2022

## I - කොටස

නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01.) ජන සමාජය තුළ ඇති කුඩාම ඒකකය කුමක් ද?
i. පාසල    ii. පන්සල    iii.පවුල    iv. රෝහල

02.) අයහපත් චිත්තවේගයක් සඳහා උදාහරණයකි.
i.සතුට    ii. දයාව    iii.කරුණාව    iv. කෝපය

03.) සමාජයේ පවතින හිතකර බලවේගයක් නොවන්නේ,
i.පවුල    ii.පාසල    iii.පවිටු මිතුරන්    iv. හොඳ පොත්පත්

04.) ඔබගේ පියාගේ නැගණිය ඔබට වන්නේ,
i.නැන්දා    ii. පුංචි අම්මා    iii.ලොකු අම්මා    iv. ඥාති සහෝදරිය

05.) ආගමික සංවිධානවලින් ඉටු නොවන කාර්යයකි.
i.ආගමික ඉගැන්වීම්    ii.සාරධර්ම හුරු කිරීම
iii.ක්‍රීඩා කටයුතු දියුණු කිරීම    iv. අධ්‍යාත්මික සංවර්ධනය

06.) නිවැරදි තොරතුරු හා දත්ත මඟින්,
i.කාලය නාස්ති වේ.    ii.ගැටළු අවම වේ
iii.මංමුලා වේ.    iv. ඒවාට වහලෙකු වේ

07.) සෑම පුද්ගලයෙකුම ඉතා හොඳින් අයිතිවාසිකම් භුක්ති විඳින විට,
i.ජීවිතය තුළ සෑහීමකට පත්විය නොහැකි වේ.
ii.යහපත් සමාජයක් නිර්මාණය වේ.
iii.මානසික ආතතිය වර්ධනය වේ.
iv. ආර්ථික ප්‍රශ්න පැන නඟී.

08.) රජයේ සේවකයෙකුට සේවයේ යෙදිය හැකි උපරිම වයස් සීමාව වනුයේ,
i.අවුරුදු 50    ii.අවුරුදු 60    iii.අවුරුදු 55    iv. අවුරුදු 65

09.) ගුරුවරුන් හා සිසුන් අතර මනා අන්තර් සම්බන්ධතාවක් පැවැත්වීම මඟින්,
i.සිසුන් කලහකාරී වේ.
ii. පරිසර ගැටළු ඇති වේ.
iii.සිසුන්ට සමබර පෞරුෂයක් ගොඩනඟා ගැනීමට හැකි වේ.
iv.සිසුන් ආත්මාර්ථකාමී වේ.

10.) වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා පවතින නීති සඳහන් වන අවස්ථාවක් නොවේ.
i.මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 28 වැනි වගන්තිය
ii.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
iii.කම්කරු නීති
iv. ආයතන සංග්‍රහය

11.) දේශපාලන අයිතිවාසිකමකි.
i.ජීවත්වීමේ අයිතිතිය    ii.අදහස් ප්‍රකාශ කිරීම
iii.සමානාත්මතාව    iv.රජයේ තනතුරු දැරීම

12.) න්‍යෂ්ටික පවුලක දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.
i.සාමාජික සංඛ්‍යාව වැඩිය.    ii.ආරක්ෂාව වැඩිය.
iii.එදිනෙදා කටයුතු සඳහා ශ්‍රමය ලබා ගැනීමේ පහසුව.    iv. සාමාජිකයන් සුළු සංඛ්‍යාවක් සිටීම.

13.) පුද්ගලයන් මුහුණපාන විවිධ අවස්ථාවන්ට සම්බන්ධ සිත තුළ ජනිත වන සිතුවිලි .................... ලෙස හැඳින්වේ.
i.අරමුණු    ii.අපේක්ෂා    iii.චිත්තවේග    iv. අභියෝග

14.) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි .................... වගන්තිය මඟින් වෘත්තිකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරනු ලබයි.
i.24    ii. 28    iii.23    iv. 25

15.) ජීව විද්‍යාත්මකව පුද්ගලයන්ගේ අනන්‍යතාව පෙන්වන සාධකයක් නොවේ.
i.DNA ව්‍යුහය    ii.ඇඟිලි සලකුණු    iii.අත්ලේ රේඛා    iv. නම

අංක 16 සිට 20 දක්වා දීඇති ප්‍රකාශන නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

16.) පවුල් ඒකක රාශියක් එකතුවෙන් ජන සමාජය නිර්මාණය වේ. (   )

17.) මිනිසාගේ කාර්මික ඥානය නිසා ජන සමාජය වඩා සංකීර්නත්වයට පත්වී ඇත. (   )

18.) නූතන ජන සමාජය ඉතා සරල ස්වාභාවයකින් යුක්ත ය. (   )

19.) න්‍යෂ්ටික පවුලට සාපේක්ෂව විස්තෘත පවුල් ඒකකයක සිටින සාමාජික සංඛ්‍යා අඩු ය. (   )

20.) පුද්ගලයෙකුගේ අධ්‍යාත්මික සංවර්ධනයට හා සාරධර්ම හුරු කිරීමට දායක වන සමාජයේ ප්‍රධානතම ආයතනය වන්නේ මරණාධාර සමිතියයි. (   )

(ල.20 X 2 = 40 )

| මහ/මහාමායාබාලිකාවිදුහල | SS |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2022දෙවන වාර | 7ශ්‍රේණිය7ශ්‍රේණිය |
| පුරවැසි අධ්‍යාපනයපුරවැසි අධ්‍යාපනය | පැය 02 යිපැය 02 යි |

විභාග අංකය / ..................................

**II කොටස**

ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

01.) (i) න්‍යෂ්ටික පවුල යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ල.03)

(ii) පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 04ක් ලියන්න. (ල.04)

(iii) පවුලේ සාමාජිකයෙක් ලෙස ජීවත් වීම නිසා ඔබට ලැබෙන ප්‍රයෝජන 05ක් ලියන්න. (ල.05)

02.) (i) අයිතිවාසිකම් යනු කුමක් ද ? (ල.03)

(ii) පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් 04ක් ලියන්න (ල. 04)

(iii) යහපත් පුරවැසියෙකු සතු ගුණාංග 05ක් ලියන්න (ල. 05)

03.) (i) භාණ්ඩයක් මිලදී ගැනීමේදී ඇසුරුම් සහිත නිෂ්පාදනවල මුද්‍රණය කර ඇති දේවල් 03ක් ලියන්න.

(ii) වර්තමාන පවුල් ඒකකය මුහුණපාන අභියෝග දෙකක් ලියන්න. (ල.04)

(iii) රැකියාවක යෙදීමෙන් ප්‍රමාණවත් ආදායමක් ලැබීම නිසා අත්වන ප්‍රයෝජන 03ක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

04.) (i) ජන සමාජය යන්න අර්ථ දක්වන්න. (ල. 03)

(ii) ජන සමාජය තුළ පවත්නා ප්‍රධාන අන්තර් සම්බන්ධතා අවස්ථා 04ක් ලියන්න. (ල. 04)

(iii) අභියෝගවලට සාර්ථකව මුහුණදීම සඳහා වර්ධනය කරගත යුතු ගුණාංග 05ක් ලියන්න. (ල.05)

05.)(i) අයිතිවාසිකම්වල ලක්ෂණ 03ක් ලියන්න. (ල. 03)

(ii) ඔබ සතු සිවිල් අයිතිවාසිකම් දෙකක් ලියා ඒ හා බැඳුණු යුතුකම් දෙකක් ලියන්න. ( ල. 04)

(iii) වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට යොදා ඇති විධිවිධාන 05ක් ලියන්න. (ල. 05)

06.) (i) ඔබ ජීවත්වන සමාජයේ දක්නට ඇති හිතකර බලවේග 03ක් ලියන්න. (ල.03)

(ii) පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බලපෑම් එල්ල කරන අහිතකර බලවේග මොනවා ද ? (ල. 04)

(iii) හිතකර බලවේගවලට අමතරව සමාජයේ ඇති වෙනත් ආයතන 05ක් දක්වන්න. (ල.05)